**රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30 - 2024**

**------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.1** රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 30 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 30 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂ පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | කාරක සභා 22ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 21 (ඉ) ඡේදය ප්‍රකාරව අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැයගත හා සත්‍ය සංඛ්‍යා අතර සන්සන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශවල අයවැය ගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කරන බව | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාරක සභා 11ක මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් ද්‍රවශීලතාවය අඩු වත්කමේ සිට අනුපිළිවෙලට කාරක සභාවේ පෙළගස්වා නොතිබුණි. | ඉදිරියේදී ජංගම වත්කම් නිවැරදි අනුපිළිවෙලට දැක්වීමට කටයුතු කරන බව | ද්‍රවශීලතාවය අඩු වත්කමේ සිට අනුපිළිවෙලට ජංගම වත්කම් පෙළගැස්විය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01හි 71 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනයේ සිට මාස 12 කට පෙර සහ මාස 12 කට පසු අයකර ගැනීමට හෝ නිරාකරණය කිරීමට බලාපොරොත්තු වන අගයන් වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, කාරක සභා 08ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ ඒකී වධිවිධාන ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කරන බව | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කාරක සභා 04 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල පිරිවැය, සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත ක්ෂය හා ශුද්ධ අගය හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ඉදිරියේදී කටයුතු කරන බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයකට ගිණුම්ගත කළ යුතු වුවද, කාරක සභා 08ක් පිරිවැය පමණක් සලකා ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ප්‍රමිතියට අනුව අවසන් තොග අගය කරන බව | ප්‍රමිත ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 16 ප්‍රකාරව ජංගම නොවන වත්කම් යටතේ කෘෂිකාර්මික වගාවෙහි සාධාරණ අගයෙන් විකුණුම් සාධාරණ පිරිවැය අඩුකර ලබා ගන්නා අගය පසුගිය වර්ෂයේ අගය සමඟ සන්සන්දනය කර, ඇති වී ඇති ලාභය හෝ අලාභය හඳුනාගෙන දාමහන ගොවිජන කාරක සභාව විසින් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | ප්‍රමිත ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | කාරක සභා 12 ක ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති ආකෘතියට අනුව සකස් කල බව | වාර්ෂිකව ඒකාබද්ධ ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඌ) | ගොවිජන කාරක සභා 02 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 21 (ඉ) ඡේදය ප්‍රකාරව ගොවිජන බැංකුවේ අතිරේක මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 23 ක වර්ෂයට අදාළ අතිරික්තය රු. 5,013,412 කින් වැඩියෙන් හා රු. 12,298,320 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් නිවැරදිව ගැලපීම කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාරක සභා 23 ක ජංගම නොවන වත්කම් රු.2,195,200 ක් අඩුවෙන් හා රු. 1,000,884 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර ජංගම වත්කම් රු. 1,419,382 ක් අඩුවෙන් හා රු. 930,077 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 08 ක වගකීම් රු.538,000 කින් වැඩියෙන් හා රු. 6,342,627 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 03 ක ශුද්ධ වත්කම් රු.128,902 කින් වැඩියෙන් හා රු. 1,051,404 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් ශේෂ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 12 කට අදාළ ගිණුම් විෂයයන් 51 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා අනුරූපී වාර්තා අනුව එම ශේෂය අතර රු.12,890,321 ක වෙනසක් පැවැතිණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | සැසඳීම් සිදු කර අනුරූපී ලේඛන මූල්‍ය ප්‍රකාශන සමග ගැලපිය යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| | අධිකාරී බලය නොලත් ගණුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 06 ක වටිනාකම රු.53,998,196 ක් වූ ජ'ර්නල් සටහන් 125 ක් අනුමත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අනුමත ජ'නල් සටහන් පමණක් යෙදිම කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 05 ක අවිනිශ්චිත ගිණුම්වල දීර්ඝ කාලයක සිට පැවත එන රු.20,315 ක හර ශේෂ හා රු. 266,270 ක බැර ශේෂ නිරවුල් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිවිතිගල ගොවිජන කාරක සභාවේ රු.230,419 ක නොවිසඳුණු ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය. | මෙම ශේෂය දීර්ඝ කාලයක සිට පැවත එන බවත් තොරතුරු සොයා ගත නොහැකි බව | විධිමත් පරීක්ෂාවක් සිදු කර ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.6 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 10ක එකතුව රු. 10,518,247 ක් වටිනා ගිණුම් විෂයන් 53 ක වත්කම් ලේඛන,ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණ නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළි ගැනීමට හෝ නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | විගණනයට ඉල්ලා ඇති සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.4 නීති,රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) | 14 වගන්තිය | කාරක සභා 05 ක ඉඩම් හිමියාට ගෙවිය යුතු බිම් ප්‍රවේණි ලෙස ගොවිජන සේවා කාරක සභාවට ලැබී තිබුණු එකතුව රු.2,538,330 ක් නිරවුල් කර නොතිබුණි. | අඳ ගොවි බිම් ප්‍රවේණි ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගොවිජන සංවර්ධන පනතට අනුව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | 22 වගන්තිය | කාරක සභා 23ක කෘෂිකාර්මික ඉඩම්වලට වඩා සුදුසු බෝග හා සත්ව පාලනය සඳහා සුදුසු සතුන් නිශ්චය කර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | දෙපාර්තමේන්තු උපදෙස් අනුව ඉදිරි වසරේදී වැඩසටහන ක්‍රියාත්මක කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (iii) | 44 වගන්තිය | කාරක සභා 14ක ගොවි සංවිධානවල ගිණුම්, ගොවිජන සංවර්ධන කොමසාරිස් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ | ඉදිරියේදී ගිණුම් සහතික කිරීමට කටයුතු කරන බව | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | නියෝජිතයෙක් විසින් පරීක්ෂා කර සහතික කර ඇති බවට තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | | |
| (iv) | 51 (1) වගන්තිය | කාරක සභා 13ක ගොවිජන සංවර්ධන සභාව සහ කේන්ද්‍රය මේ දක්වාමත් ස්ථාපනය කර නොතිබුණු අතර එම පනතේ 99 (2) (ඇ) (i) වගන්තිය මගින් ලබා දී තිබුණු බලතල ප්‍රකාරව 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 43 (1) වගන්තිය යටතේ පිහිටුවා තිබුණු ගොවිජන සේවා කාරක සභාව සහ ගොවිජන සේවා මධ්‍යස්ථානය තවදුරටත් පවත්වාගෙන එමින් තිබුණි. | ඉදිරියේදී ලැබෙන නියෝග අනුව කටයුතු කරන බව | - එම - |
| (v) | 53(4) වගන්තිය | කාරක සභා 11ක ඉඩම් ලේඛන ප්‍රතිශෝධනය කර නොතිබුණි. | දෙපාර්තමේන්තු උපදෙස් අනුව ඉදිරියේදී ප්‍රතිශෝධන කටයුතු කරන බව. | - එම - |
| (vi) | 56 (4) වගන්තිය | කාරක සභා 03ක් විසින් 2017 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 176,946 ක් වූ හිඟ අක්කර බදු, පනතේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |
| (ආ) | 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 52 වගන්තිය | කාරක සභා 14ක කෘෂිකාර්මික වැඩසටහනක් සහ සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී අතපසුවී ඇතත් 2025 වර්ෂයට සකස් කර ඇති බව දන්වා ඇත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 38 (ඊ) වගන්තිය | කාරක සභා 20ක ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | විගණන කටයුතු දිස්ත්‍රික් කාර්යාලය මඟින් සිදු කරන බව | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 110 | කාරක සභා 12ක හානි පාඩු ලේඛණයක් නඩත්තු කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී හානි පාඩු ලේඛණයක් නඩත්තු කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | මු .රෙ.137 | කාරක සභා 03ක අනුමැතියකින් තොරව වවුචර් 26 කින් රු. 405,416 ක් ගෙවීම් කර තිබුණි. | වවුචර් අනුමත කිරීමට කටයුතුකර ඇති බව | - එම - |
| (iii) | මු.රෙ.395 (ඌ) | කාරක සභා 18ක බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම මුදල් කටයුතු වලට සම්බන්ධ නැති අයෙකු කළ යුතු වුවත් එම කටයුතු කරනු ලබන නිලධාරියා විසින්ම පිළියෙළ කර තිබුණි. | නිලධාරියාගේ රාජකාරි ලැයිස්තුව අනුව බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කරන බව දන්වා ඇත. | - එම - |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 09 වගන්තිය හා මුදල් රෙගුලාසි 128 (1), 315, 880, 881 | කාරක සභා 02ක සියලුම සේවකයින් විසින් ඇප තබා නොතිබුණි. එසේම මුදල් රෙගුලාසියට පටහැනිව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇප තැන්පත් කිරීමෙන් නිදහස් කර තිබුණි. | ඉදිරියේදි ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් මත ඇප තැන්පත් කිරීමට කටයුතු කරන බවත් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් ලිපියට අනුව කෘ.ප.නි.සහකාර නිලධාරින් ඇප තැන්පත් වලින් නිදහස් කර ඇති බව | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන බැංකු චක්‍රලේඛය | | | |
| (i) | 2.4.1 ඡේදය | කාරක සභා 19ක විභව ගනුදෙනු සැලැස්ම සකස්කර නොතිබුණි. | ඉදිරියේදී පිළියෙල කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව විභව ගණුදෙනු සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ii) | 3.1 ඡේදය | කාරක සභා 10ක බල ප්‍රදේශය තුළ කෘෂි උපකරණ පදනම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ගොවි මහතුන් හඳුනාගෙන එම ව්‍යාපෘති දියත් කිරීමට ඔවුන්ව දිරිමත් කර කෘෂි උපකරණ ණය ලබාදීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව ගොවීන් බලගැන්වීම සඳහා කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (iii) | 3.4.11.(1) | කාරක සභා 18ක ආපදා ණය ආවරණ ගිණුමේ රැස්වූ රු.4,806,471 ක් ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කර නොතිබුණි. | ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 26 ක එකතුව රු. 20,589,483 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 04 ක රු. 2,451,695 ක ඌණතාවයක්ද විය. 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 ක එකතුව රු. 11,172,247 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 12 ක රු. 2,433,403 ක ඌණතාවයක්ද විය.

**2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව ගොවිජන සේවා කාරක සභා 12 ක රු. 10,514,840 ක අතිරික්තයේ වර්ධනයක් ද ඉකුත් වර්ෂයේ අලාභ ලබා තිබූ ගොවිජන සේවා කාරක සභා 09 ක් ප්‍රවර්ථන වර්ෂයේදී ලාභ ලබා තිබුණි. වෙළඳ ආදායම වැඩි වීම ,වෙළඳ නොවන ආදායම වැඩි වීම හා වෙළඳ නොවන වියදම අඩු වීම එයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාරපන ගොවිජන සේවා කාරක සභාව ඉතුරුම් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු. 5,962,333 ක ශේෂයක් පවතින බව නිරීක්ෂණය වූ අතර එම මුදල ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ආයෝජනය කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතිය යටතේ අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |
| (ආ) | නාමල්දෙනිය ගොවිජන සේවා කාරක සභාව සහනාධාර පොහොර මුදල් තැන්පත් කිරීම සඳහා ආරම්භ කර ඇති ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.51,929ක ශේෂයක් නිරූපණය වුවද, එය වර්ෂ ගණනාවකින් ගනුදෙනු සිදුනොවූ ගිණුමක් බවට නිරීක්ෂණය විය. | මෙම ගිණුම මඟින් දීර්ඝ කාලයක සිට ගණුදෙනු සිදු කර නොමැති බව | අක්‍රීය ගිණුම් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාස්සගල ගොවිජන සේවා කාරක සභාව රු.81,370 ක් වූ අරමුදල් වර්ග 02 ක් වසර කිහිපයක සිට පැවත එන අතර එම අරමුදල් සුදුසු කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල කාර්යයන්ට යොමු කිරීමට කටයුතු කරන බව | අරමුදල් නිෂ්කාර්යව නොතැබිය යුතු අතර, අපේක්ෂිත කාර්ය සඳහා යෙදවිය යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇඹිලිපිටිය ගොවිජන සේවා කාරක සභාව 2015 ජූලි 03 දිනැති අංක 7/2/15/3/3(1) දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිපියට පටහැනිව කා.ප.නි.ස නිලධාරීන් 05 දෙනෙකු විසින් 2024 වර්ෂයේ එකතුව රු.37,500 ක කාර්යාල දීමනාව ලබාගෙන තිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි ගෙවා ඇති බව | චක්‍රලේඛයට පටහැනි ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුයි. |
| (ආ) | ඇහැලියගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ මිදුල සැකසීම සඳහා බැකෝ යන්ත්‍රය පැය 8.9 ක් යෙදවීම වෙනුවෙන් රු.44,500 ක් ගෙවීම් කර තිබුණද එම කාර්ය නිසි පරිදි සිදු කළ බවට තහවුරුවක් නොතිබුණි. | කැළි කසල ඉවත් කිරීමට හා නායගිය පස් තට්ටුව ඉවත් කිරීමට ගෙවීම් කල බව | කාර්ය නිසි පරිදි ඉටු වූ බවට සනාථ කර ගෙවීම් කළ යුතු අතර, අදාළ කාර්ය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පැල්මඩුල්ල ගොවිජන සේවා කාරක සභාවේ කුඹුරු ඉඩම්වල මැණික් හැරීම සඳහා අවසරපත්‍ර ලබා ගැනීමේදී අඳගොවියාගේ එකඟතාවය ලබා නොගත් අවස්ථා හා අදාල ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා ඉඩමේ ඔප්පුවේ පිටපතක් ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය වූ අතර **ONE STOP SHOP** ක්‍රමවේදය යටතේ නිකුත් කරන එක් බලපත්‍රයක් සඳහා රු.6,500 බැගින් නිකුත් කළ බලපත්‍ර 116 ක් වෙනුවෙන් වූ රු.123,000 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ සිට නිකුත් කරනු ලබන සෑම බලපත්‍ර නිර්දේශයක් සඳහාම ගොවිජන සේවා මධ්‍යස්ථානය මඟින් මුදල් අයකරනු ලබන බව | බලපත්‍ර නිකුත් කිරීමේදී ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමත්, හිඟ මුදල් නොපමාව අයකර ගැනීමට හා ඒවා කාලීනව අය නොකල පාර්ශව වෙත පියවර ගැනීමත් කළ යුතුය. |
| (ආ) | තිඹොල්කැටිය ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් වැව් හා අමුණු 18 ක් මැනුම් කර ඊට අදාල භූමි ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | වැව් අමුණු මැණුම් කර භූමි ප්‍රදේශය ආරක්ෂා කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | කල්තොට ගොවිජන සේවා කාරක සභාව් 2024/2025 මහ කන්නය සඳහා ලෝක ආහාර වැඩ සටහන යටතේ ලැබී තිබුණු ''MOP'' පොහොර මෙ.ටොන් 33.45 කින් 2025 ජුලි 04 විගණිත දින වන විටත් ගබඩාවේ මෙ.ටොන් 2.67 ක ප්‍රමාණයක් ඉතිරිව තිබුණු නමුත් 2025 යල කන්නය, 2025 මාර්තු 31 ආරම්භව තිබුණු අතර ඒ සඳහා පොහොර නිකුත් කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන නොපමාව පොහොර නිකුත් කළ යුතුය. |
| (ඈ) | කල්තොට ගොවිජන සේවා කාරක සභාව් 2022 යල කන්නයේදී සහනාධාර කාබනික පොහොර සමඟ ගොවීන් වෙත නොමිලේ බෙදා දීමට ලැබුණු ERP පොහොර කිලෝග්‍රෑම් 23033.75 ක් මධ්‍යස්ථාන ගබඩාවේ ඉතිරිව තිබුණි. 2025 ජුලි 04 දින භෞතික පරීක්ෂාවේදී එම පොහොර මිටි වල කවර දිරාගොස් ඇති බවත් එම පොහොර තොගය නිසා ගබඩාවේ ඉඩ කඩ ඇහිරී ඇති බවත් එම පොහොර තොගය මුදලට විකිණීමට 2022 නොවැම්බර් 30 දින අවසර ලබා දී තිබුණද ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | උපදෙස් ලබා ගැනීම සඳහා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව | ඉතිරි පොහොර සම්බන්ධයෙන් විධිමත් පරිදි නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගොවීන්ගේ හා කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ කාර්යසාධනය මැනීම සඳහා සහ ඉඩම් ඵලදායීතා ප්‍රවර්ධනය කිරීම සඳහා, අස්වනු සමීක්ෂණයක් මඟින් කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාව සළකා බැලිය යුතු වුවද, කුඹුරු ඉඩම් ඵලදායීතාවය ගණනය කිරීමට වැලිගෙපොල ගොවිජන කාරක සේවා සභාව කටයුතු සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | කෘෂි කාර්මික ඉඩම්වල ඵලදායීතාව ගණනය කිරීමට කටයුතු කළ යුතු විය. |
| (ඊ) | පාංශුවල PH අගය හා විද්‍යුත් සන්නායකතාවය (ලවණ ශක්තිය) පරීක්ෂා කිරීම සඳහා වන උපකරණය 2021 ජනවාරි 29 දින වැලිගෙපොල ගොවිජන සේවා කාරක සභාවට ලැබී තිබුණ ද, එමඟින් පාංශු පරීක්ෂණ සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු ලබා දී නැත. | උපකරණය මඟින් අපේක්ෂිත කාර්ය ඉටුකිරීමට කටයුතු කළ යුතු විය. |
| (උ) | පඹහින්න ගොවිජන සේවා කාරක සභාවේ නොමිලේ සහනාධාර පොහොර වැඩසටහන් යටතේ ගොවීන් වෙත නිකුත් කිරීමට ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලැබුණු TSP පොහොර කිලෝග්‍රෑම් 1,689 ක ප්‍රමාණයක් 2025 යල් පැන ඇති බවට දක්නට ලැබුණු අතර යූරියා පොහොර කිලෝග්‍රෑම් 20,985 කින් 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය කිලෝග්‍රෑම් 13,400 න් යූරියා කිලෝග්‍රෑම් 187.995 ක් නිකුත් කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබාදීම ප්‍රමාද කිරීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි ලෙස කල් ඉකුත් වී සන වී තිබුණි. | TSP පොහොර නිකුත් කිරීමට උපදෙස් ඉල්ලා ඇති බව | විධිමත් අනුමැතිය මත යල් පැන ඇති පොහොර සම්බන්ධයෙන් කටයුතු කල යුතු අතර නියමිත දිනට පොහොර බෙදා හැරීම සිදු කළ යුතුයි. |
| (ඌ) | පඹහින්න ගොවිජන සේවා කාරක සභාවේ අක්කර 01 රූඩ් 01 පර්චස් 4.74 ක භූමි ප්‍රමාණයක් සහිත මධ්‍යස්ථාන ඉඩමේ අක්කර 01 ක පමණ කොටසක් 2023 වර්ෂයේ සිට බදුහිමියෙකු වෙත බදු දී තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ බදු මුදල් රු.11,000 ක් 2024 වර්ෂයේ අයකරගෙන තිබුණු නමුත් 2024 වර්ෂයේ බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව | ගිවිසුම්ගතව බදු දීම සිදු කල යුතු අතර හිඟ මුදල් නොපමාව අයකර ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කාරක සභා 17ක මධ්‍යස්ථාන පිහිටි අක්කර 18 රූඩ් 03 පර්චස් 14.5 ක් වූ ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් මත සියළු මධ්‍යස්ථාන ඉඩම් පවරා |

| | | | |
|---|---|---|---|
| | | | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කාරක සභා 09ක අවසන් තොග තුළ බිත්තර වී, සහල්, දියර පොහොර යටතේ රු. 789,267 ක කල් ඉකුත් වූ තොග පැවතිණි. | කල් ඉකුත් වී ඇති තොග කපා හැරීමට සහකාර කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කරන බව | තොග කල් ඉකුත් නොවන ලෙස කළමණාකරණය කළ යුතු අතර, විධිමත් අනුමැතියක් යටතේ කල් ඉකුත් වූ තොග අපහරණය කළ යුතුය. |
| (ඇ) | ගොවි ආරවුල් සඳහා විසඳුම් ලබාදීම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන නමුත් පසුගිය වර්ෂවලට අදාළව පැල්මඩුල්ල හා ඕපනායක ගොවිජන සේවා කාරක සභා 02 ක් වෙත ලැබුණු ගොවි පැමිණිලි 47 ක් සඳහා විසඳුම් ලබාදී නොතිබුණි. | පැමිණිලි පරීක්ෂණ සිදු වෙමින් පවතින බව | පැමිණිලි සඳහා විසඳුම් ලබා දීම යාවත්කාලීනව සිදුවිය යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |
| (ඈ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 30 ට අදාළ බල ප්‍රදේශවල වී වගාව සඳහා යෙදවිය හැකි පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 6,537 රූඩ් 03 පර්චස් 37.02 ක් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හඳුනාගෙන තිබූ නමුත් පුරන් කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කුඹුරු ඉඩම් සොයා බලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ ඒ ප්‍රදේශවල පවතින ප්‍රායෝගික ගැටළු මත කුඹුරු පුරන් වී ඇති බව | පුරන්ව පවතින සියලුම කෘෂි කාර්මික ඉඩම් වගා කිරීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 04 ක වගා කළ හැකි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1537.2561 ක් වුවද හෙක්ටයාර 808.7156 ක ප්‍රමාණයක් වගා කර නොතිබුණි. | වගා ප්‍රගතිය ඉහල නැංවීමට කටයුතු කරන බව | වගාකල හැකි සියලු ඉඩම් ඵලදායිව යෙදවිය හැකි වන පරිදි වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඊ) | බඹරබොටුව ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශයේ කුඹුරු ඉඩම් ඉතා සීමිත ප්‍රමාණයක් වගා කිරීමත්, ප්‍රධාන ආදායම් මාර්ග ලෙස අක්කර බදු හා කාමර කුලී පමණක් පැවතීමත්, තේ, කුරුඳු, ගම්මිරිස් වැනි බෝග ව්‍යාප්තියක් ප්‍රදේශයේ පැවතියද ගොවීන් මධ්‍යස්ථානය වෙත ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති වීමත් හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආදායමක් නොමැති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | ගොවීන්ට අවශ්‍ය සේවා වඩා කාර්යක්ෂම ලෙස සපයා ගොවීන් ආකර්ෂණය කර ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය |
| (උ) | කුඹුරු ඉඩම් නාම ලේඛනය අනුව කොලොන්න හා පනාමුර කෘ.ප.නි.ස වසම් පිළිවෙලින් 24 ක් හා වසම් 07 ක ලේඛනගත ඉඩම් ප්‍රමාණය, අක්කර බදු ලේඛනය අනුව කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ජීව ගොවි දත්ත පද්ධතිය අනුව | ඉදිරියේදී විධිමත් පරිදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගොවීන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතු |

| | | | |
|---|---|---|---|
| | කුඹුරු ඉඩම් ප්‍රමාණය අතර වෙනසක් පැවතුණි. ඒ අනුව විවිධ කාර්යය සඳහා කුඹුරු ඉඩම් විවිධ ප්‍රමාණවලින් දැක්වෙන බව නිරීක්ෂණය වූ අතර, ඉකුත් වර්ෂයන් වල පොහොර වැඩ සටහන්වලදී සහ සහනාධාර මුදල් ලබා දීමේ දී සදොස් දත්ත මත එම ආධාර ලබාදී ඇති බවද වැඩි දුරටත් නිරීක්ෂණය කෙරේ .තවද, මැනුම් කරන ලද නිවැරදි දත්ත පදනම්ව කුඹුරු ඉඩම් නාම ලේඛනයේ ප්‍රමාණයන් ද සංශෝධනය කිරීම සිදු කර නොතිබුණි. | | අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඌ) | පැල්මඩුල්ල ගොවිජන සේවා කාරක සභාවට අයත් වසම් 20 ක ඉඩම් ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනා ගැනීමෙන් තොරව සමාන ඉඩම් ප්‍රමාණයකට අක්කර බදු අයකර තිබූ අතර ඉඩම් අක්කර ප්‍රමාණය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හඳුනා ගැනීමේදී විවිධ හේතු මත හඳුනා නොගත් ඉඩම් 2024 වර්ෂයේදී හඳුනා ගැනීම මෙයට හේතු වී ඇති බව | ඉඩම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ඉඩම් ප්‍රමාණය සංශෝධනය කිරීමටත්, ඒ මත අක්කර බදු අය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (එ) | කාරක සභා 20ක දීර්ඝ කාලයක සිට අයකර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 21,890,743 ක් වූ ණයගැති ශේෂ 76 ක් 2024 දෙසැම්බර් 31 දින වනවිට අයකර ගැනීමටත් එකතුව රු. 5,387,726 ක් වූ ණයහිමි ශේෂ 87 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | තොරතුරු සනාථ කර ගත නොහැකි ශේෂ බැවින් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ලැබුණු පසු නිරවුල් කිරීමට කටුයුතු කරන බව | ණය ශේෂ කාලීනව අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමත් ණයගැති ශේෂ හඳුනාගෙන කඩිනමින් අයකර ගැනීමටත් ණයහිමි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුවීම. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 කට අයිති ගොවි අලෙවි සැල් 03 ක් හා කාරක සභා 2ක බොජුන් හල් 02 ක් නිෂ්කාර්යව පැවතිණි. | අලුත්වැඩියා කටයුතු සිදු කර ඉදිරියේදී භාවිතා කරන බව | වත්කම් අවභාවිතව නොතැබිය යුතු අතර, විධිමත් වැඩපිළිවෙලක් යොදා ඒවා උපයෝජනයට කටයුතු කළ යුතුය. |
| (ආ) | කාරක සභා 3ක රු.314,000 ක් වටිනාකමැති කාබනික පොහොර සැකසීමේ යන්ත්‍රය හා කැබලි කිරීමේ යන්ත්‍ර 02 ක් හා ට්‍රැක්ටරයක් කාරක සභා 2ක නිෂ්කාර්යව පැවතිණි. | ඉදිරියේදී කුලියට දීමට හා පොහොර නිෂ්පාදනයට යොදා ගන්නා බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාරක සභා 05ක නිල නිවාස 05 ක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතිණි. | ඉදිරියේදී අලුත්වැඩියා කර භාවිතයට ගන්නා බව | අදාළ අලුත්වැඩියාවන් සිදු කර වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 9ක ගොවි බැංකු ගිණුම් මෘදුකාංග පද්ධතිය සඳහා රු. 2,668,540 ක මුදලක් ප්‍රධාන කාර්යාලයට ගෙවා තිබුණද, යන්ත්‍ර භාවිතයට අවශ්‍ය පාස්පොත් ගොවිජන බැංකුව වෙත ලැබී නොතිබීම හා බැංකු මෘදුකාංග පද්ධතිය ස්ථාපිත නොකිරීම හේතුවෙන් පරිගණක උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කළ පසු මෙම යන්ත්‍රය භාවිතයට ගන්නා බව | අදාළ පාර්ශව සමඟ සම්බන්ධ වී කඩිනම් වැඩපිළිවෙලක් යොදා හැකි ඉක්මනින් මෙම යන්ත්‍රය භාවිතයට ගත යුතුය. |
| (ඉ) | දාමහන ගොවිජන සේවා කාරක සභාවේ 2015 හා 2016 වර්ෂයන්හීදී රු.373,896ක මුදලක් වැය කර ඉදිකර තිබුණු මධ්‍යස්ථානය සතු හරිතාගාරය නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | වත්කම් අවභාවිතව නොතැබිය යුතු අතර, විධිමත් වැඩපිළිවෙලක් යොදා භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කාරක සභා 08ක සමාලෝචිත වර්ෂය තුළදී අත්‍යවශ්‍යයෙන්ම ප්‍රතිසංස්කරණය කළ යුතු සුළු වාරිමාර්ග 248 ක් ඇතුළත් යෝජනා ඉදිරිපත් කර තිබුණද, ඉන් 214 ක් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. | ප්‍රමුඛතාව අනුව වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් වූ ප්‍රතිසංස්කරණයන් පමණක් සිදු කර ඇති බව | ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කර පුරන් කුඹුරු වගා කිරීමට ගොවීන් යොමු කිරීම සඳහා වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 කට අදාළ බල ප්‍රදේශ තුළ වැව් , අමුණු 294 කින් සමන්විත වුවද, ඉන් අමුණු 119 ක් අක්‍රිය මට්ටමේ පැවතුණි. | ඉදිරියේදී සංවර්ධනය කිරීමට කටයුතු කරන බව | අක්‍රිය වැව්, අමුණු, කෘෂි ඇළ සහ කෘෂි මාර්ග සියල්ල ක්‍රියාකාරී තත්ත්වට පත් කර ගැනීම සඳහා කෙටි කාලීන වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරිඇල්ල ගොවි ජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමකින් තොරව 2024 වර්ෂයට අදාලව රු.2,525,560 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. එසේම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක්ද අනුගමනය කර නොතිබුණි. | මේ වන විට නව ගොනුවක් ආරම්භ කර ඇති බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කළ යුතු අතර, ඊට අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ප්‍රකාරව වෙළෙඳපල මිල සැඳැහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවීමකින් තොරව 12000BTU ධාරිතාවයේ වායු සමීකරණ යන්ත්‍ර 05ක් මිල දී ගැනීම සඳහා පැල්මඩුල්ල ගොවි ජන සේවා කාරක සභාව විසින් රු.3,069,810 ක් ගෙවීම් කර තිබුණි. මෙම ප්‍රසම්පාදනයේ දී 2023 ඔක්තෝබර් 21 දින ආයතන 06 කට මිල කැඳවීම් ලිපි 2023 ඔක්තෝබර් 21 සෘජුවම යවා තිබුණි. මෙම මිල ගණන් කැඳවීමේ ලිපියේ මිල ගණන් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය හා මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීමේ කාලය දක්වා නොතිබුණු අතර 5.6 වගන්තිය ප්රකාරව මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩයේ පිරිවිතර ද සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | මිල ගණන් ලබා දී ඇති ආයතන වල කලමණාකාරීත්වය සමඟ සාකච්ඡා කල බවත් එවකට පැවති ආර්ථික අර්බුධ හමුවේ මිල ගණන් උච්චාවචනය වූ බවත් දක්වා ඇති අතර පිරිවිතර ගැනීම සිදුකර නොතිබුණු බව දක්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඇ) | රත්නපුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේදී රු. 785,406 ක වියදමක් දරා ඇලුමිනියම් කබඩ් ගැසීම සිදු කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කර ඇස්තමේන්තු සකසා නිසිලෙස මිල කැඳවීම් සිදු කළ බවට විගණනයේදී නිරීක්ෂණය නොවුණි. සෘජුවම සිදු කරන ලද මිල කැඳවීම් මඟින් එක් සැපයුම්කරුවකු තෝරාගෙන තිබුණද එහිදී තීරණය වූ අවම මිල ඇස්තමේන්තුව රු. 711,716 ක් වුවද ව්‍යාපෘතිය අවසානයේදී ඒ සඳහා රු. 785,406 ක් එනම් රු. 73,690 ක් වැඩියෙන් ගෙවීමට සිදු වී තිබුණි. | ඇස්තමේන්තුවේ ඇතුළත් නොවූ වියදම් හේතුවෙන් වැඩිපුර ගෙවීම් සිදුකර ඇති බව. | විධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව, සෑම රාජ්‍ය අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය කරමින් ප්‍රසම්පාදනය කළ යුතු වුවද, ඇඹිලිපිටිය ගොවිජන සේවා කාරක සභාව විසින්, සමාලෝචිත වර්ෂයේ අලෙවිය සඳහා මිලදීගත් එකතුව රු.2,777,740ක භාණ්ඩ සඳහා ප්‍රසම්පාදනයෙන් බැහැරව, මිලදී ගැනීම සිදුකර තිබුණි තවද ගොවිජන සේවා කාරක සභාව විසින්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් මත ප්‍රසම්පාදනය සිදුකල බව දක්වා ඇති අතර සැලැස්ම ඉදිරියේදී වෙනස් කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් නොසලකා කටයුතු කිරීම වරදක් බව |
| (ඈ) | 2023 අප්‍රේල් 26 දිනැති අංක 7/5/9/05 (මෙ.හෙ.පො) වෙළුම දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් ලිපියේ 3(v)ඡේදය ප්‍රකාරව,රු.50,000ට වැඩි වියදම් සඳහා දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, පනාමුර ගොවිජන සේවා කාරක සභාවේ කුෂන් පුටු 15ක් මිලදී ගැනීම සඳහා එකී අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව දක්වා ඇත. | නියමිත අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.9 කොන්ත්‍රාත් පරිපාලන අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කහවත්ත ගොවිජන සේවා කාරක සභාවේ රු.2,512,00ක ඇස්තමේන්තු වැඩ වටිනාකමක් සහිත මීගහවෙල අමුණේ පැතිබැම්ම ඉදිකිරීමේ කර්මාන්තය ඉටු කිරීම සඳහා 2024 අගෝස්තු 14 දින ගොවි සංවිධානයන් සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණද විගණිත දින වූ 2025 අප්‍රේල් 28 දින වන විටත් එම කාර්ය ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි. | ද්‍රව්‍ය ප්‍රවාහන වියදම සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් අදාල කාර්ය ඉටුකිරීම ප්‍රතික්ෂේප කර තිබූ බව | ශක්‍යතාවයක් ඇති කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන මනා අධීක්ෂණයකින් යුතුව කටයුතු කර ගිවිසුම් පරිදි කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | Kick Start ව්‍යාපෘතිය යටතේ පැල්මඩුල්ල බොරාල වසමේ ගොඩවෙල්ලේ ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා වැය ශිර්ෂ 281-2-2-12-2105 යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2024 මාර්තු 25 දින රු.257,400 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර දී තිබුණ ද, මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා ගිවිසුම් ගත වී තිබූ ගොවි සංවිධානය ගිවිසුම අත්සන් කළ දින සිට මාස 03 ක් ඇතුලත | උපදෙස් ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාලය වෙත ලිපියක් යොමු කර ඇති බව | ගිවිසුම්ගත වීමේදී වැඩ ඉටු කිරීම සඳහා සක්‍යතාවයක් ඇති පුද්ගලයෙකු හෝ ආයතන තෝරා ගෙන මනා අධීක්ෂණයකින් යුතුව කටයුතු කර ගිවිසුම් පරිදි කාර්යයන් ඉටු කර ගත යුතුය. |

අදාල කාර්ය නිම කොට බාරදිය යුතුව තිබුණත් 2024 අගෝස්තු 10 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ඉටු නොකිරීම හේතුවෙන් අදාල ප්‍රතිපාදන මුදල ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආපසු පවරාගෙන තිබුණි. මේ හේතුවෙන් බොරාල වසමේ ගොවීන් වගා කටයුතු සිදු කිරීමේදී අලාභ හානිවලට මුහුණ පෑමට සිදුවන බව නිරීක්ෂණය විය.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට කාරක සභා 18 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරු 109 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු කාරක සභා සහ වසම් සඳහා වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කර ඇති අතර, රජය මගින් මෙතෙක් පත්වීම් ලබාදී නොමැති බව | කාර්ය මණ්ඩල සමාලොචනයක් සිදු කර අත්‍යවශ්‍යම තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 04 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03ක සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | දිස්ත්‍රික් කාර්යාලයෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාළ අනුමැතිය ලැබී නොතිබුණු බව | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොලොන්න හා පනාමුර ගොවිජන සේවා කාරක සභාවල 2024 අයවැය ඇස්තමේන්තු හා සත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී අදායම් ශීර්ෂ 05ක විකුණුම් ආදායම්වල සියයට 62 සිට සියයට 200 ත් අතර විචලන පරාසයක් හා වියදම් ශීර්ෂ 06ක සියයට 12 සිට සියයට 96ත් අතර විචලන පරාසයක් පැවතුණු අතර, වියදම් ශීර්ෂ 02ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදල් | පිළිතුරු ලබා දී නැත. | අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා අයවැය පාලන උපක්‍රමයක් ලෙස යොදා ගත යුතුය.. |

ඉතිරි වී පැවතුණි. මේ හේතුවෙන් කාරක සභා විසින් අයවැය ලේඛනය ඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවතු වගා වැඩසටහන යටතේ ගොවිජන සේවා කාරක සභා 05 කට අදාළව ගෙවතු 463 ක් ක්‍රියාත්මක කර තිබුණද ඉන් ගෙවතු 164 ක් අසාර්ථක වී තිබුණි. | දැඩි අයහපත් කාලගුණික තත්ත්වය මෙයට හේතු වූ බව | සැළසුම් සකස් කිරීමේදී කාලගුණික, දේශගුණික තත්ත්වයද සැලකිල්ලට ගෙන පැළ බෙදා දීමට කටයුතු කළ යුතුය. |

**5. ගොවි බැංකු**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

**ගොවි බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 5ක සමාලෝචිත වර්ෂයට අදාළ අතිරික්තය රු.8,140 කින් වැඩියෙන් හා රු.623,685 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදි කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කිරීමට අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 07ක ජංගම නොවන වත්කම් රු.1,322,086 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ජංගම වත්කම් රු.1,044,990 ක් අඩුවෙන් හා රු. 21,790 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර, අදාළ පරිදි ගැලපීම් කර නිවැරදි කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 5ක වගකීම් ශේෂය රු. 2,397,099 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | - එම - |
| (ඈ) | කාරක සභා 4ක ශුද්ධ වත්කම් රු. 832,357 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | - එම - |
| (ඉ) | කාරක සභා 4ක රු. 23,918,971 ක් වටිනා ජ'නල් සටහන් 37 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ජ'නල් සටහන් සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර, එසේ අනුමැතිය ලබා නොගත් පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 08ක ලෙජරය සහ මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් 16 ක ශේෂ අතර රු. 2,115,315 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරන බව | සැසඳීම් සිදු කර නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |
| (උ) | ගොවිජන සේවා කාරක සභා 13ක ගොවි බැංකුවේ ඉතුරුම් ගිණුම් වල රු.204,673 ත් රු.2,251,646 ත් අතර පරාසයක ශේෂයන් පැවති නමුත් අතිරික්ත මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතිය යටතේ ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ගොවිජන බැංකු 23ක ණය කලට වේලාවට අයකර ගැනීම, ණය අයකර ගැනීම් ක්‍රියාවලියට සහාය දැක්වීම, කාලීනව හිඟණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම හා කාර්ය මණ්ඩල මෙහෙයවීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු පිළිබඳ අදාළ නිලධාරීන්ගේ වගකීම නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් කල් පසු වූ හිඟ ණය රු. 21,500,902 පැවතුණි. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව | බැංකු ණය කලට වේලාවට අයකර ගත යුතු අතර හිඟ ණය අයකිරීමට කටයුතු නොකළ නිලදාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ඒ) | ගොවිජන බැංකු 13ක ණය ගෙවීමේ කාල සීමාව ඉක්මවා ගොස් තිබුණ ද, අයවිය යුතු එකතුව රු.7,410,789 ක ණය මුදලින් කිසිදු ණය වාරිකයක් සහ පොලියක් ගෙවා නොතිබුණි. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරන බව | විධිමත් පරීක්ෂාවක් සිදු කර ණය ලබා දීම හා කාලීනව ණය අය නොකළ නිලධාරීන්ට පියවර ගත යුතු අතර, හිඟ මුදල් නොපමාව අයකර ගැනීමටද කටයුතු කළ යුතුය. |
| (ඔ) | ගොවිජන බැංකු 15ක මිය ගිය ණයගැතියන් 57 දෙනෙකුගෙන් එකතුව රු.1,180,747 ක් අයවිය යුතුව තිබුණි. | ඇපකරුවන්ගෙන් අයකිරීමට ලිපි යොමු කර ඇති බව | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ මුදල් නොපමාව අයකර ගත යුතුය. |
| (ඕ) | ගොවිජන බැංකු 22ක 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම් ගිණුම් 38,209 කින් ගිණුම් 24,254 ක් අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි. | තැන්පත්කරුවන්ගේ මුදල් තැන්පත් කිරීම අවම වීම හේතුවෙන් අක්‍රිය වී ඇති බව | ගිණුම් අක්‍රීය නොවී සක්‍රිය ගිණුම් ලෙස පවත්වා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |